# 11 සිරි ලංකා රට ම අපි



තමන් උපන් දේශය පිළිබඳ ඇල්මක් ඇති ඕනෑම පුද්ගලයකුගේ හදවත දේශාභිමානය, දේශානුරාගය, දේශහිතෛෂීභාවය හා දේශවාත්සල්‍යය බඳු හැඟීම්වලින් පරිපූර්ණ ය. ස්වකීය නිජ භූමියෙහි විශේෂ අනන්‍යතා ප්‍රකට වන පරිදි නිර්මාණය වූ කවි හා ගීත ආදිය පරිශීලනයෙන් එම හැඟීම් තවදුරටත් තීව්‍ර වෙයි. එබඳු හැඟීම් දේශාභිමානී හැඟීම් ලෙස හැඳින්වෙයි. 'වැසි වසිනා අහස අපි' මහගම සේකර විසින් රචිත දේශාභිමානී ගී පද මාලාවකි. රටේ දියුණුව උදෙසා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමේ අගය මේ නිර්මාණයෙන් ඉස්මතු කෙරෙයි. පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව ප්‍රමුඛ පිරිසගේ ගායනයෙන් මේ ගීය පරිපූර්ණ වී ඇත.

කවිය, ගීත පද මාලාව, නවකතාව, නාට්‍යය, චිත්‍රපටය, කෙටිකතා මෙන් ම සිතුවම්කරණයෙහි අද්විතීය දක්ෂතා ප්‍රකට කළ කෘතහස්ත කලාකරුවකු ලෙස මහගම සේකර සම්භාවනාවට පාත්‍ර වෙයි. ඒ අතරින් පාඨකයන් හා විචාරකයන්ගේ වැඩි අවධානය දිනා ගෙන ඇත්තේ ඔහුගේ කවි සහ ගීත පද මාලා යි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
මිණි දිලෙනා පොළොව අපි
සිරි ලංකා රට ම අපි

අපේ පැතුම් අහසට විහිදී යයි
කම්හල්වල දුම් වළලු දිගේ
අපේ ම දහදිය මුගුරු ගලා එයි
ගං හෝ ඇළ දොළ කඳුරු වගේ

දෙරණ පළා රතු කැට මතුවන්නට
අප අත දෙන තුරු බලා හිඳී
බලවු යොමා නෙත රටේ ම මාවත
අපේ අතින් ගොඩ නැගෙන හැටි

ගොවියෝ අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

ගත රැඳි දුහුවිලි රනබරණයි
දහදිය මඩ විලවුන් සුවඳයි
රට වෙනුවෙන් ගත සිත වෙහෙසෙයි
සිත සතුටේ උල්පත එතැනයි

ගොවියෝ අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ



මහගම සේකර

## අවබෝධය

1. මේ ගීයේ පළමු වන කොටසට අනුව රටේ ප්‍රධාන කොටස් තුන මොනවා ද?
2. ගීයේ කියැවෙන ජල මූලාශ්‍රය 5ක් නම් කරන්න.
3. රටේ මාවත ගොඩ නැගෙන්නේ කා අතින් ද?
4. රට වෙනුවෙන් ගත සිත වෙහෙසන ජනයාගේ ගත දුහුවිලි, දහදිය, මඩ කවියා උපමා කර දක්වන්නේ මොනවාට ද?
5. රටක් ගොඩ නැගීමට එහි වෙසෙන ජනයාගේ ශ්‍රම දායකත්වයේ වැදගත්කම කීමට කවියා භාවිත කර ඇති යෙදුම කුමක් ද?


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. මේ ගීතය රිද්මානුකූලව ගායනා කරන්න.
2. වෙනත් දේශාභිමානි ගීත සොයා ඒවායින් කියවෙන අදහස ලියන්න.
3. දේශාභිමානි හැඟීම් ඇති කරවන කවි පෙළක් පිළිබඳ විවරණයක් කරන්න.
4. දේශාභිමානි හැඟීම් ජනිත කරවන විවිධ සාහිත්‍යාංග සොයා ඒවායින් කියවෙන අදහස් ද ඇතුළත් වන සේ කුඩා පොතක් නිර්මාණය කරන්න.

# විශේෂණ පද

| කඩිසර | ළමයා | වේගයෙන් | ලියයි |
|---|---|---|---|
| නාම විශේෂණය | නාම පදය | ක්‍රියා විශේෂණය | ක්‍රියා පදය |

ඉහත වාක්‍යය දෙස බලන්න. එහි ‘ළමයා’ යන නාම පදය විස්තර කර දක්වන ‘කඩිසර’ යන්න නාම විශේෂණය ලෙස සැලකේ. එහි දී ‘ළමයා’ යන්න විශේෂ්‍යය ලෙස සැලකේ. නාම විශේෂණය මගින් විස්තර කිරීමට භාජනය වන බැවිනි. ‘ලියයි’ යන ක්‍රියාව විස්තර කරන ‘වේගයෙන්’ යන්න මෙහි ක්‍රියා විශේෂණය වෙයි.

ඔබ 6 ශ්‍රේණියේ දී ද නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පිළිබඳව උගෙන ඇත. ඒ දැනුම ද සිහිපත් කර බලන්න. පහත අභ්‍යාසවල නියැලී ඒ දැනුම අලුත් කර ගන්න.

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් ඡේදයෙහි ඇතුළත් වන නාම විශේෂණ පද උපුටා දක්වන්න.**

   කඳු හෙලින් ද රැරා බසින දිය දහරින් ද විශාල වනයෙන් ද තොර වූ සමබිමක් වුව ද අපේ ගම් පෙදෙසෙහි අප සිත් ගත් සුන්දර ප්‍රදේශ හිඟ නො වීය. කුඩා කැලෑ රොදින් ද එළිමහනෙහි වූ සුදු වැලිතලාවෙන් ද ගැවසීගත් බිම් පෙදෙස අප සිත් ගත් තැන්වලින් එකක් පමණි. නදී තීරය ද ඒ අසල වූ කැලෑ රොදින් වැසුණු බිම් පෙදෙස ද වෙරළ ද කවීන්ගේ සිත් ගන්නා කඳු හෙල් වන ළැහැබ් වලාකුළු යන ආදි සුන්දර වස්තූන් මෙන් අපගේ සිත් ගත්තේ ය.

   (අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ)

| නාම විශේෂණ පද | විශේෂ්‍යය |
|---|---|
| | |

2. **පහත සඳහන් නාමපදවලට සුදුසු විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

   i. කරත්තය
   ii. පාර
   iii. මගියා
   iv. අශ්වයා
   v. වෙළෙන්දා

3. **පහත සඳහන් ඡේදයෙහි දැක්වෙන ක්‍රියා විශේෂණ පද තෝරන්න.**

   රියෙහි නැගුණු මගියෙක් ගවයා වේගයෙන් දුවවන්නට වෑයම් කොට නො හැකි වූ ඇතැම් විටෙක උපාලිස්ට බැණ වදියි. උපාලිස් සිනා සෙමින් පාත් වී හඳයාගේ කොන්දට අත ගසා, අනිත් අතින් ගත් කෝටුව උගේ දෙකකුල් අතරින් යවා 'හා පුතා යං' යි කියයි. ගමන ඉක්මන් කරවනු පිණිස කෝපයෙන් කතා කරන මගියාගේ බස තේරුම් ගත්තාක් මෙන් හඳයා ද වේගයෙන් දුවයි.

   (වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ)

4. **පහත දැක්වෙන ක්‍රියාපදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

   i. බලයි
   ii. ගියේ ය
   iii. පතිත විය
   iv. සෙලවිණි
   v. ගයති



නොමිලේ බෙදා හැරීම සඳහා ය.